දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය
2011 ඔක්තෝබර්/නොවැම්බර්
General Degree Examination in Arts (External) Part I
October/November 2011

සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය
SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි.

**පළමු වන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන, ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

## I කොටස

(01) පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ)
කතක මුත් වරල් දොඹහෙත් අවටැ හිවි දල
දලබර කෙමි බමරවල සිරි ලද සේ මහ පියුම

ළඟා එත නිරිඳු සහ මල් පලු සිරිසියෝ
මුහුලස කතක ගැලෙන හළ පහළත තුළු බිඟුවැල

පියා වුහුටත් යතුරු හෝනා පියක පියවුරු
කනකල සෙව් පුළුපු දුන් නරනිඳු බිසෙව් මඟලේ

(කව්සිළුමිණ - ඇම්.බී. ආරියපාල (සංස්))

(ආ)
මත් පිනවන යස සිරි තෙද නැණ විපුල
සෙත් යුද ජය රජ බව තනතුරු සියල
දෙත් නෙත් පැකු විට සුබ වැඩ දිගා බල
පින් නම් සතුන් කළ දෙව් රජ මය මෙ කල

තුන් ලෝ තමා නතු කළ රවුළු සොහොවුරු
තුන් කල් බලා රම්දුට වූ ඉටු මිතුරු
තුන් වේ ඇදුරු පුලතිසි කුල මිණි මිතුරු
තුන් විටෙකම වඳු එ සුරිඳු පා තඹුරු

(සැළලිහිණි සන්දේශය - සුචරිත ගම්ලත් (සංස්))

(ඇ)
සලක වමින් සුරඹ ලෙ සේ
තිසැක සබා මැද පිවි සේ
නොයෙක නළඹ නටති නො සේ
එදැක කෙනෙක් යෙද්ද කෙ සේ

කෙළිමින් තැන තැන ල න්දූ
දෙන මෙන් කන අම බි න්දූ
කියමින් සොඳ ගී සි න්දූ
ඇසුවන් සිත දුක් සි න්දූ

(ගුත්තිල කාව්‍යය - ඩබ්. එෆ්. ගුණවර්ධන (සංස්))

(ඈ)
නඳන ගුණ නුවණ යුතු උතුමෝ මහත
නොගෙන කිසි කරුණු සත සුවපත් කරත
දිළෙන සා මඩුලු යුතු තුරු පෙළ දිමුත
යනෙන සත සතපමින් ගිම් දුර හරිත

ඉසුරින් රුවින් සරි අය වෙසෙතත් නොමඳ
කුලුණින් ලොව රකිනු එක් උතුමෙකි පබඳ
මැඩියන් බුදින නා කැල ඇති වද විසඳ
දරමින් දෙරණ සිටිනේ නත නා ම වෙද

(සුභාෂිතය - සුචරිත ගම්ලත් (සංස්))

(ලකුණු 28 යි)

## II කොටස

(02) ආලංකාරිකයන්ගේ මහාකාව්‍ය ලක්‍ෂණවලට අනුකූල ව කව්සිළුමිණ රචනා වීම නිසා බෝසත් සිරිතකින් ප්‍රකට විය යුතු ආධ්‍යාත්මික ලක්‍ෂණ බැහැර වී ඇති අයුරු උදාහරණ සපයමින් සාකච්ඡා කරන්න.

(03) අර්ථ ධ්වනිය හා ශබ්ද ධ්වනියේ අපූර්ව සංකලනය ගුත්තිලයෙහි කාව්‍යාත්මක බව තීව්‍ර කර ඇති අයුරු නිදසුන් සපයමින් විස්තර කරන්න.

(04) "සැළලිහිණි සන්දේශය අග්‍රගණ්‍ය කාව්‍යයක් වී ඇත්තේ තත්කවියාගේ අපූර්ව වර්ණනා චාතුර්යය නිසා ය." ඔබට අභිමත වැනුම් දෙකක් ඇසුරින් අදහස් දක්වන්න.

(05) "සුභාෂිතය තත්කාලීන සමාජ අවශ්‍යතාවක් සපුරනු වස් රචිත කෘතියකි." විමසන්න.

## III කොටස

(06) සිංහලයේ ලිංග විභාගය පිළිබඳ පවතින සාම්ප්‍රදායික මතය නිදසුන් සහිත ව විචාරයට ලක් කරන්න.

(07) සිංහල භාෂාවේ "ක්‍රියා" නම් ව්‍යාකරණාංගය පිළිබඳ කුමාරතුංගයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ විග්‍රහය සමාලෝචනය කරන්න.

(08) 'විභක්ති' යනු කුමක් දැ'යි හඳුන්වා, කර්ම විභක්ති ප්‍රයෝග කවරේ දැ යි සනිදර්ශන ව පහදන්න.

(09) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් තුනකට ලුහුඬු විවරණ සපයන්න.

(i) වෙසෙසුන් සමස්
(ii) අසබහවි කිරිය
(iii) සද පියෙවි
(iv) තෙමෙ කතු තෙමෙ කම්
(v) වර්ගාක්ෂර
(vi) ෂට් කාරක

(02 - 09 පිළිතුරුවලට ලකුණු 18 බැගිනි)

oooooooooooooooooooooooooooooo